# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1778/6 - 2012 ඔක්තෝබර් මස 02 වැනි අඟහරුවාදා - 2012.10.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

නියමය

1999 අංක 14 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනතින් සංශෝධිත, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2, 4 සහ 6 වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වන කොටසේ නිරූපිත ප්‍රදේශය එම පනතේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් විය යුතු යයි ප්‍රකාශ කරමි ;

(2) එම උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති සීමා ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පරිපාලන සීමා ලෙස නියම කරමි ;

(3) මෙම නියමයේ (1) වන ඡේදය යටතේ ප්‍රකාශයට පත් කරන ලද ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර ඒ ප්‍රාදේශීය සභාවට පහත සඳහන් නාමය පවරමි :

"මිල්ලනිය ප්‍රාදේශීය සභාව"

(4) මිල්ලනිය ප්‍රාදේශීය සභාව සභාපතිවරයකු, උප සභාපතිවරයකු, සහ තෝරාපත් කර ගත් වෙනත් සභිකයින් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතු යයි නියම කරමි ;

(5) මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ නිල කාලය ආරම්භ විය යුතු දිනය 2015 අප්‍රේල් මස පළමුවන දිනය වශයෙන් නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

1A - G 001399— 435 (2012/10)

*උපලේඛනය*

*I වැනි කොටස*

කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාස වලින් සමන්විත භූමි ප්‍රදේශය -

(638) උඩුවර බටහිර, (638 ඒ) උඩුවර නැගෙනහිර, (638 බී) උඩුවර උතුර, (638 සී) උඩුවර දකුණ, (639) පාතකඩ, (639 ඒ) දෙල්ගොඩ, (639 බී) මහදුරුපිටිය, (640) යටවර උතුර, (640 ඒ) යටවර දකුණ, (640 බී) බේගමුව තලහිටිය, (641) පනාගොඩ, (642) ගල්පාත නැගෙනහිර, (642ඒ) ගල්පාත බටහිර, (643) පැල්පොල, (643 ඒ) පුන්සිරිපුර, (643 බී) ඉඹුලහේන, (644) පරගස්තොට, (644 ඒ) දෙල්කඩ, (644බී) දික්හේන, (644සී) රද්දෙගොඩ, (645) මිල්ලනිය, (645 ඒ) අරකාගොඩ (645බී) දෙල්දොරවත්ත (646) ලගාන, (646 ඒ) මාවත්ගම, (647) හල්තොට, (647 ඒ) ලෙනවර, (647 බී) කෙලෙස්ගමුව, (649) බටගොඩ, (649 ඒ) දොඹගොඩ, (649 බී) මුල්කඩකන්ද, (649 සී) අදිකාරිගොඩ, (651) යාලගල, (651 ඒ) වෙනිවැල්පිටිය, (651බී) මිල්ලගස්පොල, (652) කැන්නන්තුඩාව, (652 ඒ) බොරලැස්ස, (653) ලබුගම, (653ඒ) පෙතිගමුව දකුණ, (653 බී) පෙතිගමුව උතුර, (654) වැලිකල, (654 ඒ) තිබ්බොටුගොඩ, (655) ගුංගමුව සහ (655ඒ) බැල්ලන්තුඩාව.

*II වැනි කොටස*

මිල්ලනිය ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පරිපාලන සීමා-

*උතුරට :*

කළුතර සහ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පොදු මායිම, මිල්ලනිය සහ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම හමුවන ආරම්භක ලක්ෂ්‍යයේ සිට බණ්ඩාරගම සහ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ ඊසාන දෙසට, නැගෙනහිර දෙසට හා උතුරු දෙසට එකී මායිම හොරණ හා බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට හොරණ සහ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ ගිණිකොන දෙසට ඊසාන දෙසට සහ ගිණිකොන දෙසට එකී පොදු මායිමට මදුරාවල හා හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද ;

*නැගෙනහිරට :*

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට මදුරාවල හා මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ එකී මායිම කළු ගඟේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද ;

*දකුණට :*

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කළු ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ එකී මධ්‍ය රේඛාව දොඩන්ගොඩ සහ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද ;

*බස්නාහිරට :*

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කළුතර සහ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ වයඹ දෙසට සහ උතුරු දෙසට එකී මායිම ආරම්භක ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද මායිම් වේ.

10-687/1

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

1999 අංක 14 දරන ප්‍රාදේශීය සභා (සංශෝධන) පනතින් සංශෝධිත, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9අ වන වගන්තියේ (අ) සහ (ආ) ඡේදවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ඒ. එල්. එම්. අතාඋල්ලා වන මම, 1987 මැයි මස 12 දිනැති අංක 453/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව සංස්ථාපනයට අදාළ නියමය, මෙම නියමයෙන් -

(1) (අ) එහි උපලේඛනය ඉවත් කර මෙහි උපලේඛනය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි ;

(ආ) එහි (4) වන ඡේදයේ සඳහන් "දාසය දෙනෙකුගෙන්" යන පද ඉවත් කර ඒ වෙනුවට "එකොළොස් දෙනෙකුගෙන්" යන පද ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

(2) යථෝක්ත සංශෝධන 2015 අප්‍රේල් මස පළමුවන දින සිට බලාත්මක විය යුතු යයි නියම කරමි.

ඒ. එල්. එම්. අතාඋල්ලා,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

*I වන කොටස*

කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය -

(656) රයිගම දකුණ, (656 ඒ) රයිගම උතුර, (656 බී) රයිගම නැගෙනහිර, (656 සී) රයිගම බටහිර, (657) පනාපේ, (657ඒ) කොලමැදිරිය උතුර, (658) කිම්මන්තුඩාව, (659) අටලුගම නැගෙනහිර, (659 ඒ) අටලුගම බටහිර, (659 බී) කොරවල, (659සී) බමුණුමුල්ල (මුස්ලිම්), (659ඩී) ගල්ගෙමණ්ඩිය, (659ඊ) බෝගහවත්ත, (660) බමුණුමුල්ල, (660ඒ) එපිටමුල්ල, (661) ගැලනිගම, (661 ඒ) කොතලාවල, (662) වෑවිට, (662 ඒ) යටියන, (663) බණ්ඩාරගම, (663ඒ) බණ්ඩාරගම නැගෙනහිර, (663බී) බණ්ඩාරගම බටහිර, (664) වීදාගම නැගෙනහිර, (664ඒ) වීදාගම බටහිර, (665) රඹුක්කන උතුර (665ඒ) රඹුක්කන දකුණ, (665බී) බොල්ගොඩ, (666) කඹුරුගොඩ නැගෙනහිර, (666ඒ) කඹුරුගොඩ බටහිර, (667) ගම්මන්පිල (667ඒ) රේරුකාන, (667 බී) වල්ගම උතුර, (667සී) සමරනායකපුර, (667 ඩී) වල්ගම දකුණ, (668) අලුත්ගම, (668 ඒ) මැදගම, (668 බී) ඇලෝතියාව, (669) කිඳෙල්පිටිය බටහිර, (669 ඒ) කිඳෙල්පිටිය නැගෙනහිර, (669 සී) සේනපුර, (678) මහඅරුක්ගොඩ, (678ඒ) කුඩා අරුක්ගොඩ නැගෙනහිර, (678 බී) නිවුඩාව, (678 සී) කුඩා අරුක්ගොඩ බටහිර, (688) පින්වල නැගෙනහිර, (688 ඒ) පින්වල බටහිර, (688 බී) වඳුරමුල්ල බටහිර, (688 සී) වඳුරමුල්ල නැගෙනහිර, (690) මහවිල, (690ඒ) මාදුපිටිය, (690 බී) මිරිස්වත්ත, (691) අලුබෝමුල්ල නැගෙනහිර, (691 ඒ) අලුබෝමුල්ල බටහිර, (691 බී) බටදොඹතුඩුව, (694) පමුණුගම, (694 ඒ) ඉඹුල්ඉහ, (694 බී) දිගනතුඩුව, (695) මහබෙල්ලන සහ (695 ඒ) මහාවත්ත.

*II වන කොටස*

බණ්ඩාරගම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පරිපාලන සීමා -

*උතුරට :*

බණ්ඩාරගම සහ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම කොළඹ කළුතර දිස්ත්‍රික් මායිම හමුවන ආරම්භක ලක්ෂ්‍යයේ සිට දිස්ත්‍රික් මායිම ඔස්සේ නැගෙනහිර දෙසට එකී දිස්ත්‍රික් මායිම, හොරණ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට නිරිත දෙසට හොරණ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ එකී මායිම (606) ගොඩිගමුව හා (607 සී) කුඹුක උතුර යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද ;

*නැගෙනහිරට :*

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට දකුණු දෙසට හොරණ -බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ එකී පොදු මායිම (656 ඒ) රයිගම උතුර හා 655 ගුංගමුව යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට දකුණු දෙසට බණ්ඩාරගම, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ එකී මායිමට (645) මිල්ලනිය හා (644 සී) රද්දේගොඩ යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද ;

*දකුණට :*

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට බටහිර දෙසට බණ්ඩාරගම, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ මිල්ලනිය - කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට බටහිර දෙසට බණ්ඩාරගම - කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ එකී මායිමට කළුතර - පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට බටහිර දෙසට පානදුර-බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ එකී මායිම පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (697 ඒ) තල්පිටිය දකුණ සහ (696) පින්වත්ත යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පොදු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද,

*බස්නාහිරට :*

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට පානදුර - බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පොදු මායිම ඔස්සේ උතුරු දෙසට ආරම්භක ලක්ෂ්‍යය දක්වා අඳින ලද රේඛාවකින් ද මායිම් වේ.

10-687/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.